**කැකිරාව ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් භාණ්ඩ පරිත්‍යාග ලැබීම් රු.308,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීමක් ලෙසද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමක් ලෙසද දක්වා තිබුණි. | පිළිගන්නා බව. | මුදල් ගලායාම් සහ ගලා ඒම පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී සලකා බැලිය බැලිය යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 24 දින නව කාර්යාල ගොඩනැගිල්ලට ගෘහ භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් දරා තිබුණු රු.1,556,200 ක වියදම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | සමාලෝචිත වර්ෂයට අදාල වත්කම් සහ ආදායම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඇ) | ස්ථාවර තැන්පත් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළ පොලී රු.3,493,610 ක් සඳහාවූ රු.174,680 ක 5% රඳවා ගැනීමේ බද්ද ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | සමාලෝචිත වර්ෂයට අදාල වියදම් සහ ජංගම වත්කම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අයත් ස්ථාවර වත්කම් පොලී රු.34,055 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සේවක ණය පොලී රු.565,329 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස දැක්වීම වෙනුවට ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | -එම- | මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වන ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී තැන්පත් කරන ලද රු.59,745,000 ක ස්ථාවර තැන්පත් සහ ආපසු ගැනීම් රු.46,261,824 ක් පිළිබඳව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | -එම- | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වන මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගත යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී හඳුනා ගන්නා ලද රු.40,000,000 ක්වූ ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා නොතිබුණි. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයට අදාල සටහන 19 අනුව කෙටිකාලීන ගෙවිය යුතු දැවල අඩුවීම රු.14,288,839 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු.14,059,824 ක් වීම නිසා රු.229,015 ක වෙනසක් විය. | ආරම්භක ශේෂ ගැලපීම අනුව වෙනසක් නොමැති බව. | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.323,178,124 ක් වූ ගොඩනැගිලි, මාර්ග බෝක්කු හා පාලම් පිළිබඳව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය | සභාවේ වත්කම් වාර්ෂික බදුදීම වෙනුවෙන් ලැබිය යුතු ආදායම් රු.968,981 ක් පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගෙන් විධිමත් අනුමැතියකින් තොරව අය නොවන ශේෂ ලෙස 2022 වර්ෂයේදී කපාහැර තිබුණි. | කපාහැරීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් ලබාගෙන පමණක් කපාහැරීම් යුතුය. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හි iv ඡේදය | ඇඟිලි සලකුණු යන්ත්‍ර අනුව පැමිණීම සහ පිටවූ වේලාවන් සනාථ කර නොගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි. | පිළිගන්නා බව. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු19,526,542. ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු25,931,467 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,346,305 | 8,310,096 | 7,967,449 | 5,834,240 | 8,198,230 | 8,158,681 | 7,224,176 | 5,491,593 |
| (ii) | කුලී | 16,545,100 | 11,559,206 | 12,244,842 | 6,060,675 | 13,384,960 | 10,622,672 | 8,566,737 | 6,746,311 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 5,899,650 | 4,675,015 | 4,920,215 | 345,000 | 3,615,970 | 2,720,973 | 2,687,743 | 590,200 |
| (iv) | වෙනත් ආදායම් | 23,376,000 | 49,893,169 | 107,199,470 | 5,835,219 | 26,055,180 | 27,052,101 | 48,887,724 | 63,141,520 |
| | | 54,167,055 | 74,437,486 | 132,331,976 | 18,075,134 | 51,254,340 | 48,554,427 | 67,366,380 | 75,969,624 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.4,551,829 ක් විය. | පිළිගන්නා බව. | පනතේ විධිවිධාන අනුව හිඟ වරිපනම් බදු අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර සහ කර්මාන්ත බදු හිඟය රු.264,650 ක් විය. | හිඟ මුදලින් කොටසක් අයකරගෙන ඇති බව. | ඉතිරි හිඟ මුදල්ද අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ලේඛන අනුව 1997 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව රු.773,887 ක විනෝද බදු අයවීමට තිබුණි. | මෙම සිනමා ශාලාව පිහිටි ඉඩම තවත් අයෙකුට විකුණා ඇති අතර සිනමා ශාලාහිමිකරු මියගොස් ඇති බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඇති බව. | කාලීනව විනෝද බදු අය නොකිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර අදාළ කටයුතු සිදු කළ යුතුය. |
| (iv) | වසර 05 කට වරක් වරිපනම් තක්සේරු කළ යුතු වුවත් 2004 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් සිදුකර නොතිබුණි. | නව තක්සේරුවක් ලබාගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර ඇති බව. | නව තක්සේරු ලබා ගැනීම කඩිනම් කළ යුතුය. |

**(ආ) කුලී**

| | | | |
|---|---|---|---|
| (i) | 2020 සහ 2021 වර්ෂවලදී වාහන සහ යන්ත්‍ර ණයට ලබාදීම නිසා අයවිය යුතු කුලී රු.2,187,515 ක් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ii) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකුලී රු.1,594,800 ක් සහ වෙළඳ කුටි කුලී රු.48,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | -එම- |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 03 කට අදාළව ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම රු.145,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු වලින් කොටසක් ගෙවා ඇති බව. | ඉතිරි හිඟ දැන්වීම් පුවරු ගාස්තුද අයකර ගත යුතුය. |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,487,088 ක් හා මුද්දර ගාස්තු රු.4,348,131 ක් ලැබී නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැකිරාව, මරදන්කඩවල, බණ්ඩාරපොතාන, උල්පත, අළුත් බලළුවැව, ගනේවල්පොල, කොල්ලන්කුට්ටිගම සහ මඩාටුගම යන ස්ථානවල මස්හල් පවත්වාගෙන යන නමුත් එම මස්හල් සඳහා අවශ්‍ය වන ගෝසාතකාගාර පහසුකම් සභාව විසින් සපයා නොතිබුණි. | ඉදිකිරීමට කටයුතු කරන බව. | ගෝසාතකාගාර පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව සහා බලප්‍රදේශයේ ඇති ගව මස්හල්වල අලෙවි කරන ගව මස් සඳහා සභාවේ ලාංඡනය භාවිතා කිරීම වෙනුවෙන් කිලෝ 01 ක් සඳහා රු.10 කට නොවැඩි ගාස්තුවක් අයකිරීමට සහ ඝාතනය කරන සතුන්ගේ විස්තර අදාළ ආකෘතිය ප්‍රකාරව ලබාගැනීමටද සභාව කටයුතු කර නොතිබුණි. | -එම- | ගාස්තු අයකර ගැනීමටත් විස්තර ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් සභාව විසින් සකස් කර නොතිබීම නිසා ගලි රථයෙන් ලබාගත හැකි ආදායම සභාවට අහිමිවී තිබුණි. | මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු ස්ථානයක් සකස් කරන බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ඈ) | මරදන්කඩවල නගරයේ තිබෙන අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමටත්, මඩාටුගම අනවසර ඌරු මස් අලෙවිසැල ඉවත් කිරීමටත් සභාව අවධානය යොමුකර නොතිබුණි. | විධිමත් කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වායා උල්පත පිහිටි සභාවට අයත් ගබඩා සංකීර්ණය රු.10,000 ක මාසික කුලියට ලබාදීමට සභා තීරණයක් ගෙන තිබුණු නමුත් එය කුලියට ලබාදීමට 2022 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති බව. | පසුවිපරම් කර කුලියට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දහම් පාසල් සහ ආගමික සිද්ධස්ථාන සඳහා ආධාර වශයෙන් ලබාදී තිබුණු රු.100,000 ක් අදාළ කාර්යය සඳහා නොයොදවා පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි. | මෙම මුදල් අදාල කාරණය සඳහා යෙදවීමට කටයුතු කරන බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 ජුනි සිට දෙසැම්බර් දක්වා අනියම් සේවක වැටුප් ගෙවීමේදී අයකළ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සඳහා වූ දායක මුදල් රු.173,314 ක් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | දායක මුදල් යැවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බලප්‍රදේශයේ නව ඉදිකිරීම්, නැවත එකතු කිරීම්, ඉවත් කිරීම් සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර තාවකාලික තක්සේරුවට හෝ වරිපනම් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | සමීක්ෂණයක් සිදුකළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් ඉවත් කිරීමට යෝජනා කර තිබුණු වටිනාකම රු.272,625 ක්වූ භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරන බව. | අපහරණය කඩිනමින් නිම කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ ද්විතියික මට්ටමේ තනතුරු 05ක පුරප්පාඩු 10ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 06ක පුරප්පාඩු 19ක්ද පැවතුණු අතර අතර අනියම් සේවකයින් 23ක්ද බඳවාගෙන තිබුණි. | මේ පිළිබඳ අදාල ආයතන දැනුවත් කර ඇත. | පුරප්පාඩු පිරවීමටත් අනියම් සේවකයින් තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්‍රාම ගිය සහ සේවය හැර ගිය නිලධාරීන් 04 ක ගෙන් අයවිය යුතු රු.249,650 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |